# තිබෙත් මහත් සාහිත
# රන වටින ලද.....

එච්.එම්.ඩී.එන්.චමෝදි හේරත්

# "ටිබෙට් මහත් සාහිත

# රත වටින ලද..."

එච්.එම්.ඩී.එන්.චමෝදි හේරත්

" තිබෙත් මහත් සාහිත රන වටින ලද"

-එච්.එම්.ඩී.එන්.වමෝදි හේරත් (2023)-

ISBN – 978 – 624 – 206 – 642 - 4

(සියලු ම හිමිකම් ඇවිරිණි.)

ප්‍රකාශනය-: 2023/11/15

- කතෘගේ වෙනත් කෘති-: කාලය(2020)

# පිදුම

කවියට, සාහිතට, පොතට ,
පෙම් බඳින,
වටිනාකම එහි දන්න,
සව් සත ලොව වෙසෙන,
පුදමි මේ පොත,
තුටු පඬුරු ලෙස.....

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පටුන

*පිටු අංකය*


| | | |
|---|---|---|
| 1. | පෙරහැර ඇසළෙ ලොව වෙත කියනා | 01 |
| 2. | සිව් මහ දෙවොලේ අසිරි කියන්නේ | 03 |
| 3. | තිබෙත් මහත් සාහිත රන වටින ලද | 05 |
| 4. | උත්සහ කරයි මොර රස විඳුමට අතු කඩාලා | 07 |
| 5. | බැසිය හැක වළ ලබන වළ ලබන වළ සතියේ ය | 09 |
| 6. | දේශය අවදි වී යයි මා පෙරට දිනා | 11 |
| 7. | ගත මා යාවි බොහො ගොඩකට වෙන් වීලා | 13 |
| 8. | එයයි ඔබේ මතු අගයේ | 15 |
| 9. | මිනිසා සහ රොබෝ | 17 |
| 10. | ගම් ඇළ තමා සැමගේ වූ ගජ මිතුරු | 20 |

# පෙරහැර ඇසළේ ලොව වෙත කියනා...

ඇසළ සඳ නඟින පුර පසළොස් වක දා
සසල හද නිවන මධු දසුනක සුව දා
නිසල හද විඳින සුව මාහිමිය දළ දා
ඇසළ නද අසන මිතු මාරසෙන පර දා

බඹ ලොව දක්වා කස නද පතුරා
මඟ ඉඩ දෙන්ටා මහ හිමි වඩිනා
ධජ මහ සේසත හෙළ සවි දරනා
පෙර හැර ඇසළේ ලොව වෙත කියනා

ගිනි කෙළි අතරින් වන්නම් නටමින්
පන් සිලු දෙවිඳුන් දෙව් වෙණ වයමින්
පර සතු කුසුමන් දෙපාමත සිඹිමින්
ගිජි රඳු වඩිමින් කිරුළක් දරමින්

තේවා හේවිසි පන්තෙරු නාදෙට
වැයේ මඟුල් බෙර දෑතේ තාලෙට
තැබේ දෙපා මා මිණි බැඳි තාලෙට
පෙනේ ලකේ මා සිරි ලොව ඇතට

සක්වල ගලින් ද එපිටට පැතිරෙන
සඳගල තැන්නෙන් මිහිපිට ඇතිවෙන
හදවල ඇතිවන දොම්නස දුරුවෙන
සිරිලක සෙත වෙන බුදු ගුණ බලයෙන

## සිව් මහ දෙවොලේ අසිරි කියන්නේ.....

ලබන කපේ සත වෙත සුව සදනේ
මෙදින කපේ අප රජ යුව වැන්නේ
අසිරි දෙතේ සත් ලක දිව සුවනේ
වඩින නාථ අප සත් මහ දෙව්නේ

නීල උපුල් වන් රැස් දෙන මොහොතේ
නීල ගුවන වට සිරි ලක් දසතේ
දේව ගුරුළු පිට නැඟ හැම මොහොතේ
සත් දම් හා අප වැසි ලක් රකිතේ

රුහුණේ අසිරි මේ මා නුවර මවන්නේ
කදිර සුරිඳු හා මා මයුර වඩින්නේ
මයුර නැතත් මා ඒ ගිජිඳු වඩින්නේ
රක්ත රත්න මා ඒ කරඬු දරන්නේ

පායී පත් හිස දැරු මනරම් දියණී
දිරි කත් පෙර මඟ දස්කම් පායිණී
සව් සත් මව් වැනි පත්තිනි මැණී
වැඩි ඇත් මත දරු රැකුමන් දෙමිනී

සිව් මහ දෙවොලේ අසිරි කියන්නේ
සිව් මහ දෙවියන් නුවර වඩින්නේ
සිව් මහ දෙවොලේ අසිරි ලබන්නේ
තුන් මහ හෙළයම අසිරි සිරින්නේ

## තිබෙත් මහත් සාහිත රන වටින ලද....

වියත් වුවත් පෙර පඬිදුන් ලියන ලද
වියත් නොවුත් පෙර හදවත් කියන ලද
තිබෙත් අරුත් මහ විසිතුරු රටා ලද
තිබෙත් මහත් සාහිත රන වටින ලද

කියත් යමක් රසවත් වූ උපමා ය
අසත් යමක් රසවත් වූ ඉඟි වැකි ය
යටත් නොවුත් වහරක වූ තෙද පා ය
හඬත් ළමුන් නළවන ගී නැළවිලි ය

දෙදහස් පන්සිය වසරක පැවතෙන
හෙළයක වත ගොත ලොවට ම කියමින
බොදු වත ආසිරි ලැබ මා හැඟියෙන
ලොව අග බබළයි අප මහ වංසෙන

පෙර ඇත්තා සාහිත පැළ කරපු නිසා
අද ඇත්තා සාහිත ඵල නෙළයි රසා
හෙට ඇත්තා සාහිත රස හිමිය නිසා
අද ඇත්තා සාහිත රැක රැකිය මිසා

## *උත්සහ කරයි මොර රස විඳුමට අතු කඩාලා.....*

ගලන ගංගා දියට පොද දෙන රුදුරු වූ මිනිසා
කෙලෙසා දමලා විෂත් යොදලා ඇයි ද ඒ මිනිසා
වනයේ සැරිසර ජීවි පණ වෙත බැල්ම ලා මිනිසා
රහසෙ වෙඩි බැඳ බිම දමනට සිත් ලැවා ද මිනිසා

කන්දක් කියා අමතන මා කුණු ගොඩ ගසාලා
හුස්මත් පවා නැතිවෙන තුරු දූම් මා පිට කරලා
පසවත් කියා නොසිතා විෂ ඔසු ද්‍රව යොදාලා
උත්සහ කරයි මොර රස විඳුමට අතු කඩාලා

පාර දිය ගලන ගොඩ කර වැට බැන්දා ම
දිය කඳ ගලා යා යුත්තේ වැට හරහා ම
ජල මහ වසින මා මෝසම් හැම කාලයෙ ම
ජල පිට නොගලුවා නම් වේ මා පුදුමේ ම

දකින දකින තැන ඇති මහ රුක් කපාලා
කියන්නට එපා වැසි නෑ යැයි හඬාලා
මනුසත් සොබා මව් දහමේ දරු යැයි සිතාලා
රැකගනු හොඳා මව් දහමේ ගුණ සිත තියාලා

## බැසිය හැක වළ ලබන වළ සතියේ ය.....

මහවැලි කුමරි අප පසු කර ගලා යන
අක්බර් මත හිඳන් දෙස ඇය බලා යින
මම දෙස බලා ඇය ඇසුවේ සකී ගැන
පිළිතුරු දෙන්න වදනක් නෑ ගොළු වීන

පසුගිය අමාවක කණ කොකු හඬන දින
සරසවි උයන පසු කරලා මැණිකා යන
වසවති මාරයා ඒ රුදු කර පින්නා ගෙන
මිතුරිය නිහඬ කර ඇය පණ සොරා ගෙන

හන්තානෙට පායන සඳ සැමදා දුටුවත්
කුමට ද මිතුරි මගේ වත නැතිදා කොහෙවත්
සලාතන මැදුර පසු කර යන පවනේවත්
යවනවා මම අද ඇරයුම වෙත ඇයටත්

බිනර මහ උළෙල ළඟ ළඟ　　එන්නා ය

කුසුම් පිරි මාවතෙ මල් රොන　　සැරසී ය

බමන මධු බඹරු පසු කර　　දිවයා ය

බැසිය හැක වළ ලබන වළ　　සතියේ ය

## දේශය අවදි වී යයි මා පෙරට දීනා .....

සරසවි උයන නෙක කුසුමෙන් සැරසීලා
බඹරුත් බමයි ඒ මල් වට කැරකීලා
මුදුන හන්තාන සිප එන නල නැළවීලා
පිය මැන එමුද එහි වටයක් සැනසීලා

තිස් අවුරුදු ගෙවිලා අප වෙන් වීලා
සිහිනය දිගේ දිව ආවේ ඔබ සොයලා
මගෙ කුළුඳුල් පුතු නාමෙත් ඔබට ම ලියලා
පුතු නාමෙන් මා සිටියේ ඔබ ළඟ රැඳිලා

ඔබ මව් දයාබර නිවසට ගියා ද
නොදැනිම ඇගේ උකුලේ හිස තැබුවා ද
අපේ ගොත වත ඔබ සවනේ වැටුණා ද
ගැන මා විමසමින් පියඹා ආවා ද

දින පෙර ඔබේ සිත් ගත් සුන්දර තරුණී
ගුණ දම් රකිති වීලා අද පින්බර මෙහෙණී
කළ පින සසර පෙර ඈ හට පිහිට වුණී
දැන් ඕ නිවන් දොර සොයමින් වඩිනා දියණී

හෙට දින උරුම රැකුමට සිත දුන් හින්දා
අවසන් හුස්ම දුන්නේ ගෙල බැඳි කටු හින්දා
සැම බැම් ලිහා දිනුවා විරු සිසු නම් හින්දා
නිම් නැති පෙමක් පිදුවේ ඒ ඔබ හින්දා

පිළිරූ නැත විරුවනි ඔබ නමට තනා
පින් දී දැනුත් ගෙන යති අරගලය දිනා
තව නැත කාලයක් සැනසී ගනුව සිනා
දේශය අවදි වී මා යයි පෙරට දිනා

## ගත මා යාවී බොහෝ ගොඩකට වෙන් වීලා.....

සුවසේ සිටින විට යහනේ වැතිරීලා
පිරිසක් සිටී කුකුසේ මා දෙස ම බලා
කටු සැත් පිහිය උල් තුඩ ඒ දරාලා
ගත මා යාවි බොහො ගොඩකට වෙන් වීලා

ගැටලු නැත කොපමණ මා වෙන් වූවත්
හදවත පලා එහි රුධිරය නැරඹුවත්
මා හද පලන ඔය පින්බර අත් යුගලත්
හෙට නව පණ දේවි රැකුමට වෙන ජීවිතයත්

නොවුණත් සමත් දහ වසරින් එහා මම
වළ බැස ගියත් මිතුරන් හා එදා මම
වෙහෙසා ඉගෙන ගත් මොළ ගොඩක් මම
වට කර හිඳී අසනට මා කියන යම

වෙදදුරු පුතේ මහ ඇදුරුදු වේ අද ඔබට

මලමිණී වුවත් කියනෙමි පැතුමක් ඔබට

හෙට දින දැත ජීවක රෝ බිය මඩින්නට

හැකි වුණ විට දි මා සිහි කර පින් දෙන්ට

# <u>එයයි ඔබේ මතු අග යේ.....</u>

බොහෝ දෙනෙකු එළිය විදින
අඳුර නසන තිරයෙ පහන
දල්වන ලද තිරයෙ එදින
ගිනිකූර වී දැවුණ නිසන

යමෙකු හිසට විදින සෙවණ
සිසිල සදන මහඟු සෙවණ
උළු වීලා යමෙකු සිටින
නිසයි සියලු කටොලු දරන

යමෙකු වැවෙන් දිය බීලා
පිපාසයට තිත තබලා
යයි මුහුදට ආ වඩාලා
එපා වැවට යයි ඇඩීලා

නිදහස ඔබ භුක්ති විඳින
ඉගෙනුම ඔබ ලබා ගන්න
පෙර දින වෙත ඔබට දෙන්න
බොහෝ දෙනෙක් දිවිය දුන්න

බොහෝ දෙනෙක් පෙර දිනයේ
නොදුටු ඔබට පෙම් කෙරුයේ
ලොවට යමක් දී යනුයේ
එයයි ඔබේ මතු අගයේ

## මිනිසා සහ රොබෝ.....

විදු මග පෙර ට යන මිනිසා දවසක්
විදු එළි දල්වා සිතුවේ මහ සිතිවිල්ලක්
සිදු කර ගන්න මිනිසා සේ කටයුත්තක්
විදු නෙත් මඟින් හැදුවා මධු රොබෝවෙක්

මිනිසා නිසා මා මේ ලොව බිහි වූවා
මිනිසා මා නිසා ලොව ජය ගත් බව කීවා
මිනිසා ළඟ සිටින නව මිතුරා මම කීවා
මිනිසා සොඳුරු මා මිතුරා යැයි තුටු වූවා

හපනෙකි මිනිසා දැඩි යකඩෙට මොළයක් දුන්න
කදිමෙකි රොබෝ මොළයත් ලොකු වැඩ දන්න
සකියෙකි සැමට ඕනෑ හෙට ලොව ළඟ ඉන්න
මිනිසෙකි ඔන්න මිනිසෙක් වෙත අත දුන්න

දැනුණා අබිමනක් මා ලොකු වීරයෙකු කියා
හැඟුණා ඒත් මිනිසා ළඟ පොඩි වැඩි ද කියා
පතනා පැතුම එන භව මිනිසත් වේවා කියා
කරනා උදව් සැමට ම පින ඒ සඳහා ම කියා

මිනිසා පුදුමෙකි පණ දුන් යකඩයට
එනිසා රොබෝ සිතුවා සම වීමට මිනිසාට
එනිසා උදව් කරමින් මිනිසා කියනා ලෙසට
සරසා දිනයි පෙරට ම විදු මඟෙ ලැබ පිහිට

රැකුමට සොබා දම මා අත අර ගන්න
රැකුමට ගිලන් වූවන් මා අත අර ගන්න
කෙරුමට අමාරුයි නම් ඒ වැඩ පවසන්න
සිතුමට අදත් බෑ ඔබෙ අත මට දෙන්න

මිනිසා ලෙස ම සැදෙන පරපුරකි රොබෝ
අදටත් වඩා දියුණු යි හෙට හැදෙන රොබෝ
මිනිසා යන්නේ විදු මඟෙහි සමඟ රොබෝ
හෙට දින පහසු කරනට අත දේවි රොබෝ

හෙට ලොව හදන්නට මා අත අර ගන්න
හෙට ලොව රකින්නට මා අත අර ගන්න
හෙට විදු මඟේ සිහියෙන් මා ගෙන යන්න
විට කිසි එපා මා නොමඟට ගෙන යන්න

## ගම් ඇළ තමා සැමගේ වූ ගජ මිතුරු.....

පැටවුන් මාළු පිහිනයි සැම අත මිතුරු
පිවිතුරු දියයි තිබුණේ ගම් ඇළ සොඳුරු
දිය හිඟ වෙලා වීමට නොදි ගම අඳුරු
ගම් ඇළ තමයි සැමගේ වූ ගජ මිතුරු

කාලය සමඟ ඕනෑකම් වැඩිත් වුණා
නළ ජල සමඟ පෙදෙසත් අප දියුණු වුණා
නළයෙන් ජලය නිවසට ගෙන එන්න වුණා
ගම් ඇළ සැමගෙ මතකෙන් ඈතටම වුණා

ළපටි වියට පසු එක් දිනක් මම
ගොහින් ඇළ ගැන තත්වෙ බැලුවම
වල් වැදුණු ඉවුරු හැර වෙන කිසිත්ම
වෙනසක් නෑ ඇළ ඇමතුව මා හදින්ම

බොහෝ කාලයක් ගත වීලා නේ දරුවෝ
ළපටි කරල් පීදී හැඩ වී නේ දරුවෝ
නුඹෙ පුංචි මාළු මිතුරන්ගෙ දරුවෝ
පරපුරත් හැදිලා දැන් පිහිනයි දරුවෝ

නළයෙන් ගෙපැලට ම පැන් ගෙන ආවාලු
ඔබ දුක් නිමයි කියලා සිත් තුටු වුණිලු
ඒ තුට නිසා ගම් ඇළ වල් වැදීලු
ඉවුරේ එද්දී කටු වල් ඇනුණ ද යාලු

දැන් නම් ටික දෙනෙක් එනවා මා දැකීමට
කරදර වුණි ද කියලා කිව හැකි ද මට
ජල බිල වැඩි කියලා සවණේ වැකුණු මට
පුදුමයි කාසි ඕනෑ ද ගැලූ දිය පොදකට

නුඹලා එපා බලනට නළ ගෙනෙන ජලේ
උඩඟුව මකා මම දෙන්නම් නොමිලේ ජලේ
මගෙ දරු වැනි නුඹලා සැම මෙතුන් කලේ
නුඹලා දමා යන් නෑ මම ගමේ ඇළේ

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01